41

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි සිව්වන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2017 ජූලි/ අගෝස්තු

ආර්ථික විද්‍යාව

# ECON 4165.02 – පරිසර ආර්ථික විද්‍යාව

- කාලය පැය තුන (03) යි.
- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**
- අත් අකුරු පැහැදිලි විය යුතුය.

01. i). පරිසර ආර්ථික විද්‍යාවේ අවශ්‍යතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii). ස්වභාවික සම්පත් හා පරිසර සම්පත් අතර වෙනස උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 04)

iii). "පරිසර ආර්ථික විද්‍යාඥයා ආර්ථික විද්‍යාඥයාට වඩා වෙනස් කාර්යයක නිරත වේ." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 07)

02. i). "හිඟකම පිළිබඳ සංකල්පය සැලකීමේ දී මෝල්තස් දැක්වූ අදහස්වලට වඩා පෝල් අර්ලිෂ්ගේ අදහස් වඩාත් ප්‍රායෝගික වේ." මෙම ප්‍රකාශය විභාග කරන්න. (ලකුණු 10)

ii). "පරිසරය ගතික පාරිභෝජනයක් සහිත භාණ්ඩයකි." පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. i). දේපළ අයිතිය යන සංකල්පය හඳුන්වා එය පරිසර ආර්ථික විද්‍යාවට අදාළ වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii). "පරිසර ආර්ථික විද්‍යාවේ දී සිදුවන්නේ පරිසර සම්පත් සම්බන්ධයෙන් සැඟවුණු වෙළෙඳපොළ *(missing market)* නිර්මාණය කිරීම ය." මෙම ප්‍රකාශයෙහි වලංගුභාවය පරිසර ආර්ථික විශ්ලේෂණයන් සමඟ විභාග කරන්න. (ලකුණු 08)

04. i). විවෘත ප්‍රවේශ දේපළක් *(open access property)* යනු කුමක් ද? එවැනි දේපොලක් හායනයට ලක්වන්නේ කෙසේ ද? විස්තර කරන්න. (ලකුණු 08)

ii). විවෘත ප්‍රවේශ දේපළක් ප්‍රජාව සතු කිරීමේ අවශ්‍යතා මොනවාද? (ලකුණු 08)

05. i). පොදු භාණ්ඩයක සමාජ ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කරන ආකාරය රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii). "පොදු භාණ්ඩයක් මඟින් ආකාර්යක්ෂම වෙළෙඳපොළක් නිර්මාණය වේ." රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

06. i). "බාහිරතාවන් අභ්‍යන්තරීකරණය කිරීමෙන් සිදුවන්නේ ඒවා සඳහා වෙළෙඳපොළක් නිර්මාණය කිරීම ය." මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න. (ලකුණු 08)

ii). පාරිසරික දූෂණයන් වැළැක්වීමට, අවම කිරීමට හා ඒවායේ බලපෑම පහත හෙළීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීමට ලක්කරන්න. (ලකුණු 08)

**********